**මතුගම ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**--------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.226,536,910 ක් වූ අතර ස්ථාවර වත්කම් ගිණුම් ශේෂවල එකතුව රු.225,813,107 ක් වීම නිසා එම ගිණුම් අතර රු.723,803 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2011 වර්ෂයේ වියදම් ණයහිමි ලෙජර් ශේෂය රු.1,009,030 ක් වැඩියෙන් තුලනය කර දැක්වීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.100,030 ක් පමණක් ණයහිමි ගිණුම හා අවිනිශ්චිත ගිණුමට ගැලපීම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත සඳහා ලැබී තිබූ මූලධන ආධාර රු.2,768,680 ක් තැන්පත් ගිණුම බැරකර තිබීම නිසා ආදායම් හා වියදම් ගිණුමේ මූලධන ආධාර බිල් කිරීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ මුදල් පොතේ දක්වා තිබූ කර්මාන්ත ගෙවීම්වලට වඩා වැඩියෙන් රු.4,439,581 ක් මූලධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබීම නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.957,341 කින් පමණක් ගිණුම් ගැලපීම් කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ මාගේ වාර්තාවේ දක්වා තිබූ ගිණුම්කරණ අඩුපාඩු 06 ක් සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කිරීම් කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

දිගු කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන එකතුව රු.454,225 ක් වූ ගිණුම් ශේෂ 02 ක් අයකර ගැනීමටත්,විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.6,920,036 ක් වූ ශේෂය නිරවුල් කිරීමටත් පියවර ගෙන නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

යාවත්කාලීන කරන ලද ලේඛන,උපලේඛන හා තොග සමීක්ෂණ වාර්තා නොමැති වීම නිසා එකතුව රු.242,033,949 ක් වූ ගිණුම් ශේෂ 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,549,979 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,260,916 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 6,494 | 4,042 | 8,165 |
| (ii) | බදු කුලී | 5,492 | 4,729 | 1,125 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 179 | 174 | 67 |
| (iv) | වෙනත් ආදායම් | 350 | 350 | - |

2.2.2 වරිපනම් බදු

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.7,395,187 ක්ද , සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම රු.4,414,236 ක් වූ අතර 2014 දෙසැම්බර් 31 දින වන විට ආරම්භක හිඟයෙන් රු.1,751,873 ක් හෙවත් සියයට 24 ක්ද,බිල් කිරීම්වලින් රු.2,172,250 ක් හෙවත් සියයට 49 ක්ද අය කර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට සභාවේ ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයේ රු.5,000 කට වඩා හිඟ ශේෂයක් සහිත වරිපනම් බදුකරුවන් 273 කගෙන් අයවිය යුතු ශේෂය රු.2,543,888 ක් විය.

2.2.3 අක්කර බදු
-------------
සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.147,645 ක් වූ හිඟ අක්කර බදු ශේෂයෙන් 2015 ජූනි 30 දිනට රු.83,327 ක් පමණක් අය කර ගෙන තිබුණි.

2.2.4 කර්මාන්ත හා ව්‍යාපාර බදු
------------------------------
සමාලෝචිත වර්ෂයේ ඔක්තෝම්බර් 31 දිනට පැවති රු.407,934 ක් වූ කර්මාන්ත හා ව්‍යාපාර බදු හිඟ ශේෂයෙන් රු.350,794 ක් ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයේ ආයතන 132 කින් අය වීමට තිබුණි.

2.2.5 වෙළඳ ස්ථාන කුලී
----------------------
සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතුව තිබූ රු.1,006,220 ක් වූ වෙළඳ ස්ථාන කුලී ශේෂයෙන් 2015 මැයි 30 දිනට රු.474,579 ක් පමණක් අය වී තිබුණි.

2.2.6 උසාවි දඩ
-------------
පළාත් සභාවේ ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.16,500,000 ක් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 අවිධිමත් ගනුදෙනු
---------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 132(ඒ) වගන්තිය අනුව යම් ආගමික,පුණ්‍ය,සංස්කෘතික,සෞඛ්‍ය,විනෝදාත්මක හෝ අධ්‍යාපන කාර්යයක් සම්බන්ධයෙන් වර්ෂයකට මුළු එකතුව රු.1,000 කට වඩා වැඩියෙන් වැය කරනු ලබන්නේ නම් ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2014 සාහිත්‍ය උත්සවය වෙනුවෙන් රු.124,559 ක් වැය කර තිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 177 අනුව වියදම රු.5,000 ක් හෝ එය ඉක්මවන කවර හෝ වැඩක්,සේවාවක් ක්‍රියාත්මක කිරීම සඳහා මිල ගණන් කැඳවිය යුතු වුවත් එසේ මිල ගණන් කැඳවීමකින් තොරව රු.128,075 ක වාහන අළුත්වැඩියා වියදමක් සිදුකර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

(අ) 2010 මාර්තු 04 දින රු.87,765 කට මිලදී ගෙන සවිකර තිබූ ඇඹිලි සලකුණු යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබූ අතර 2012 ඔක්තෝම්බර් මාසයේ යන්ත්‍රයට අකුණු දැර වැදීම නිසා අක්‍රීය තත්ත්වයට පත්වීම හේතු කොට ගෙන 2012 ඔක්තෝම්බර් 23 දින යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා සැපයුම් ආයතනය වෙත භාර දී තිබුණද, විගණිත දිනය වූ 2014 නොවැම්බර් 20 දින වන විටත් නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විගණිත දිනය වූ 2014 නොවැම්බර් 20 වන විට සභාව සතුව පැවති බැකෝ යන්ත්‍ර 02 ක හා ටිපර් රථ 02 ක් සඳහා ඉන්ධන ලීටර් 27,100 ක් වෙනුවෙන් රු.3,256,410 ක් වැය කර තිබුණි.නමුත් එම වාහන සේවයේ යෙදවීමේදී ලේඛනයක් හෝ ඒවායේ කාර්යයන් සඳහා ඉදිරි වැඩ සැලසුම් නොතිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 203 ඡේදය අනුව සභාවේ දේපළ සම්බන්ධයෙන් පූර්ණ සමීක්ෂණයක්ද ,217 අනුව සියලුම ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක්ද,ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්ද සිදු කළ යුතු වුවත් සභාවේ ප්‍රධාන කාර්යාලයේ 2011 වර්ෂයෙන් පසු ඉහත සමීක්ෂණයන් සිදු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 සැප්තැම්බර් 30 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 174 ක් වූ අතර ස්ථිර කාර්ය මණ්ඩලය 154 ක් විය.ආදේශක,ව්‍යාපෘති හා කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන තිබූ සේවකයින් 53 ක් වූ අතර ඒ අය සඳහා වැටුප් හා දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේ ඔක්තෝම්බර් දක්වා රු.6,745,644 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ii) අනුමත තනතුරු 10 ක සේවකයින් 20 දෙනෙකුගේ ඌණතාවයක් විය.

(iii) ආදේශක හා කොන්ත්‍රාත් පදනමට රියදුරන් 03 දෙනෙකු බඳවා ගෙන රියදුරු සේවයේ යොදවා තිබූ අතර ස්ථිර රියදුරෙකු විගණිත දින වන විට සභාවේ විදුලි අංශයේ විදුලි ආලෝක දැල්වීමේ හා නිවීමේ කාර්යයේ යොදවා තිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්
------------------------------------------

සභාව විසින් මිලදී ගෙන තිබූ හා පරිත්‍යාග ලෙස ලැබී තිබූ පහත සඳහන් වත්කම් වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පැවතුණි.

- පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ 2013 පෙබරවාරි 01 දින රු.300,675 ක වටිනාකමකට මිලදී ගෙන තිබූ තණකොළ කපන යන්ත්‍රය.
- 2013 හා 2014 වර්ෂවල රු.139,000 ක වටිනාකමකට මිලදී ගෙන තිබූ තණකොළ කපන යන්ත්‍ර 08.
- 2010 වර්ෂයේ සභාවට ලැබී තිබූ නූල් 5 දහර කම්බි 66 ක්.
- 2013 අගෝස්තු 18 දින වාහන සේදීම සඳහා රු.33,416 ක වටිනාකමකට මිලදී ගෙන තිබූ අධිපීඩන යන්ත්‍රය.
- වෙල්ඩින් ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍රය.
- 2012 ජනවාරි 13 දින ඒකක පිරිවැය රු.700 කට මිලදී ගෙන තිබූ ඇඳි රහිත ප්ලාස්ටික් පුටු 55 ක්.

- 2011 අප්‍රේල් 20 දින ආපදා කළමනාකරණ අධිකාරියෙන් ලැබී තිබූ ලීටර් 1,000 වතුර ටැංකියක්.

3.5 අක්‍රිය ගිණුම්
---------------

සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය නමින් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීම් ගිණුමේ වර්ෂ ගණනාවක සිට පැවත එන රු.260,421 ක් වූ ශේෂයක් නිශ්කාර්යව පැවතුණි.

3.6 හඳුනා ගත් අලාභ
--------------------

(අ) පාඨකයින් විසින් බැහැර ගෙන ගොස් ආපසු භාර දී නොතිබූ රු.37,467 ක් වූ පුස්තකාල පොත් 181 ක් විගණිත දිනය වූ 2015 මැයි වන විටත් නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දිවි නැඟුම දෙපාර්තමේන්තුවෙන් 2014 නොවැම්බර් මාසයේදී සභාවට ලැබී තිබූ GI බට 488 කින් විගණිත දිනය වූ 2015 අප්‍රේල් 30 දින වන විට GI බට 247 ක් පමණක් සභාවේ පැවතුණි.මෙසේ ලැබී තිබූ GI බට නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු නොතිබූ අතර මේ සම්බන්ධයෙන් තොග ලේඛනයක්ද පවත්වා නොතිබුණි.

4. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වියදම් පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය